# මාසික
# විවරණිකාව

2011 පෙබරවාරි



**ශ්‍රී ලංකා මහ බැංකුව**

# ශ්‍රී ලංකා මහ බැංකුව

## විවරණිකාව

61 වැනි වෙළුම 02 වැනි කලාපය

## 2011 පෙබරවාරි

ශ්‍රී ලංකා මහ බැංකුවේ විවරණිකාව, මාණ්ඩලික සංස්කාරක කමිටුවක විධානයන් යටතේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මාසිකව නිකුත් කරනු ලැබේ.

නිල වාර්තා හා පෞද්ගලික නම්වලින් පළ කෙරෙන ලිපි හැර, මෙහි පළවී ඇති අනෙකුත් අර්ථ කථනයන් සහ අදහස් සම්බන්ධයෙන් එම කමිටුව විසින් වගකීම දරනු ලැබේ. එසේ වුවද, මෙම අර්ථ කථනයන් සහ අදහස් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ අදහස් ලෙස පිළිගත යුතු නොවේ.

හිමිකම් ඇසුරුණු බව දක්වා ඇති අවස්ථාවන්හි දී හැර, මෙම විවරණිකාවෙහි පළවෙන ඕනෑම කරුණක් පූර්ව අනුමැතියක් නොලබා සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් හෝ නැවත පළ කිරීමට හෝ පරිවර්තනය කිරීමට අවසර ඇත. එහෙත් එසේ නැවත පළ කිරීමේදී හෝ පරිවර්තනය කිරීමේ දී එම කරුණු ශ්‍රී ලංකා මහ බැංකුවෙන් සහ විවරණිකාවෙන් උපුටා ගත් බව සඳහන් කළයුතුයි.

**ISSN 1391 - 3654**

**ප්‍රකාශය: ශ්‍රී ලංකා මහ බැංකුව , කොළඹ 01.**

| පටුන | | පිටුව |
|---|---|---|


1 වන කොටස - මාසික සිදුවීම් .... 05

2 වන කොටස - පුවත්පත් නිවේදන - 2011 පෙබරවාරි .... 06

1. 2011 ජනවාරි මස උද්ධමනය .... 06
2. නව මුදල් නෝට්ටු කාණ්ඩය .... 07 - 10
3. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් සමීපස්ථ ණය පහසුකම යටතේ සයවන ණය වාරිකය වශයෙන් එ.ජ.ඩොලර් මිලියන 216.6 ක් නිකුත් කෙරේ .... 10
4. මුදල් ප්‍රතිපත්ති විවරණය - 2011 පෙබරවාරි .... 11 - 12
5. අග්නිදිග ආසියානු මහ බැංකු අධිපතිවරුන්ගේ 46 වෙනි සමුළුව, උසස් මට්ටමේ සම්මන්ත්‍රණය සහ අග්නිදිග ආසියානු මහ බැංකු අධිපති මණ්ඩලයෙහි 30 වෙනි සමුළුව .... 12
6. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද) 2009,2010 සහ 2011 .... 13

# 1 වන කොටස

# මාසික සිදුවීම්

## 2011 පෙබරවාරි

### රාජ්‍ය මූල්‍ය අංශය

- අර්තාපල් සඳහා වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝග්‍රෑමයකට රුපියල් 10 සිට කිලෝග්‍රෑමයකට රුපියල් 20 දක්වා ඉහළ නංවන ලදී.

### ආසියානු සංවර්ධන බැංකුවෙන් ලද ණය

යාපනය සහ කිලිනොච්චිය ජල සැපයුම් හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය මූල්‍යනය කිරීම සඳහා 2011 පෙබරවාරි මස 08 වැනි දින ශ්‍රී ලංකා රජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර ගිවිසුම් දෙකකට අත්සන් තබන ලදී. ඊට අදාළ තොරතුරු පහත පරිදි වේ.

(1) **වි.ගැ.හි. මිලියන 44.29 ක් වූ ණය මුදල (ආසන්න වශයෙන් රුපියල් බිලියන 7.6)**

මෙම ණය මුදල සඳහා සහන කාලය තුළ දී සියයට 1.0 ක වාර්ෂික පොලී අනුපාතිකයක් ද, සහන කාලයෙන් පසුව සියයට 1.5 ක වාර්ෂික පොලී අනුපාතිකයක් ද අදාළ වේ. වසර 8 ක සහන කාලයකට යටත්ව වසර 32 ක් තුළ දී මෙම ණය මුදල ගෙවා නිම කළ යුතුය.

(2) **එ.ජ.ඩොලර් මිලියන 20 ක් වූ ණය මුදල (ආසන්න වශයෙන් රුපියල් බිලියන 2.2)**

මෙම ණය මුදල සඳහා ලන්ඩන් අන්තර් බැංකු අර්පණ පොලී අනුපාතය මත සියයට 0.6 ක වාර්ෂික පොලී අනුපාතිකයක් අදාළ වන අතර ඉන් සියයට 0.3 ක් ආපසු ගෙවනු ලැබේ. තවද ප්‍රයෝජනයට නොගත් ශේෂය මත සියයට 0.15 ක අනිවාර්ය ගෙවීමක් ද අදාළ වේ. වසර 6 ක සහන කාලයකට යටත්ව වසර 25 ක් තුළ දී මෙම ණය මුදල ගෙවා නිම කළ යුතුය.

### ජපාන අන්තර්ජාතික සහයෝගිතා ආයතනයෙන් ලද ප්‍රදාන

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ රූපවාහිනී නිෂ්පාදන උපකරණ වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය මූල්‍යනය කිරීම සඳහා 2011 පෙබරවාරි මස 10 වැනි දින ශ්‍රී ලංකා රජය සහ ජපාන අන්තර්ජාතික සහයෝගිතා ආයතනය අතර ජපන් යෙන් මිලියන 41.70 ක (ආසන්න වශයෙන් රුපියල් මිලියන 56.1 ක) ප්‍රදානයක් සඳහා ගිවිසුමකට අත්සන් තබන ලදී.


## 2 වන කොටස

# පුවත්පත් නිවේදන

## 2011 පෙබරවාරි

### 1. 2011 ජනවාරි මස උද්ධමනය

*ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද.) (2002 =100) මගින් මනිනු ලබන ලක්ෂ්‍යමය උද්ධමන අනුපාතිකය, ප්‍රධාන වශයෙන් පදනම් බලපෑම හේතු කොට ගෙන 2010 දෙසැම්බර් මස පැවති සියයට 6.9 හි සිට 2011 ජනවාරි මාසයේ දී සියයට 6.8 දක්වා පහත වැටුණි. මේ අතර, පසුගිය මාස 12 ක කාලපරිච්ඡේදය තුළ සිදු වූ මිල විචලනයන්හි ප්‍රතිඵලයක් ලෙස වාර්ෂික සාමාන්‍ය උද්ධමනය, පූර්ව මාසයේ පැවති සියයට 5.9 හි සිට ජනවාරි මාසයේ දී සියයට 6.0 දක්වා ඉහළ නැගුණි. කො.පා.මි.දර්ශකයේ භාණ්ඩ පැසෙහි ආහාර සහ බලශක්ති නොවන අයිතමයන්ගේ මිල විචලනය මගින් මනිනු ලබන මූලික උද්ධමනය, 2010 දෙසැම්බර් මාසයෙහි ලක්ෂ්‍යමය පදනම මත පැවති සියයට 5.6 සහ වාර්ෂික සාමාන්‍ය පදනම මත පැවති සියයට 6.3 හි සිට 2011 ජනවාරි මාසයේ දී පිළිවෙලින් සියයට 3.6 සහ සියයට 6.0 දක්වා පහළ වැටිණි.*




දර්ශකයෙහි සියයට 1.3 ක් වූ මාසික ඉහළ යෑම සඳහා ආහාර හා මධ්‍යසාර නොවන පාන (සියයට 2.1) උප කාණ්ඩයේ මිල ඉහළ යෑම ප්‍රධාන වශයෙන් දායක විය. ආහාර උප කාණ්ඩයේ මිල ගණන් ඉහළ යෑමට අධික වර්ෂාව නිසා එළවළු, පළතුරු, පොල්, පොල් තෙල්, රතු ළූණු, මත්ස්‍ය සහ මුහුදු ආහාරවල සැපයුම අඩුවීම මූලික වශයෙන් හේතු විය. කෙසේ නමුත් සහල්, බිත්තර, කුකුළු මස්, ලොකු ළූණු සහ සීනි මිල පහත වැටිණි. තවද, රෙදිපිළි හා පාවහන් (සියයට 2.1); අධ්‍යාපන (සියයට 1.6); සෞඛ්‍ය (සියයට 0.3); ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා දෛනික ගෘහ ඒකක නඩත්තු කටයුතු (සියයට 0.1); සහ විවිධ භාණ්ඩ හා සේවා (සියයට 0.9) යන උප කාණ්ඩවල මිල ඉහළ යෑම් වාර්තා විය. ගෑස් මිල ඉහළ දැමීම හේතුවෙන් නිවාස, ජලය, විදුලිය, ගෑස් සහ අනෙකුත් ඉන්ධන යන උප කාණ්ඩයේ සුළු මිල ඉහළ යෑමක් දක්නට ලැබිණි. මේ අතර, විනෝදාත්මක හා සංස්කෘතික, ප්‍රවාහන සහ සන්නිවේදන යන උප කාණ්ඩවල මිල ගණන් මෙම මාසය තුළ දී නොවෙනස්ව පැවතිණි.

## 2. නව මුදල් නෝට්ටු කාණ්ඩය

*ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සංවර්ධනය, සෞභාග්‍යය හා ශ්‍රී ලංකාවේ නැටුම් ශිල්පීන් යන තේමාව යටතේ නව මුදල් නෝට්ටු කාණ්ඩයක් 2011 පෙබරවාරි 04 වන දින නිකුත් කෙරේ. මෙය ශ්‍රී ලංකා මහ බැංකුව 1950 පිහිටුවීමෙන් පසුව නිකුත් කරන එකළොස් වන ව්‍යවහාර මුදල් නෝට්ටු කාණ්ඩයයි. දැනට සංසරණයේ පවතින 10 වන ව්‍යවහාර මුදල් නෝට්ටු කාණ්ඩය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හඳුන්වා දෙන ලද්දේ මීට වසර 20 කට පෙර 1991 වසරේදී ය. නව ව්‍යවහාර මුදල් නෝට්ටු කාණ්ඩය රු. 5,000, රු. 1,000, රු. 500, රු. 100, රු. 50 හා රු. 20 ලෙස මුදල් නෝට්ටු වර්ග 06 කින් සමන්විතය. ආර්ථික වර්ධනයත් සමග ප්‍රසාරණය වන ගණුදෙනු පහසු කිරීමට වැඩි වටිනාකමකින් යුත් රු.5,000 නෝට්ටුව හඳුන්වා දී ඇත.*

දැනට සංසරණයේ පවතින මුදල් නෝට්ටු කාණ්ඩයත් නව මුදල් නෝට්ටු කාණ්ඩයත් අතර ඇති ප්‍රධාන වෙනස්කම වන්නේ නෝට්ටුවල ප්‍රමාණයයි. නව මුදල් නෝට්ටු කාණ්ඩයේ සියළුම වටිනාකමින් යුත් මුදල් නෝට්ටු සමාන පළලින් යුක්ත වන අතර, එහි දිග, කුඩාම වටිනාකමේ සිට ඉහළ වටිනාකම දක්වා පිළිවෙළින් මි.මී. 5 බැගින් වැඩි වේ.

**මුදල් නෝට්ටුවල ඇති ප්‍රධාන ලක්ෂණ පහත දැක්වේ.**

| වටිනාකම | නෝට්ටුවේ ප්‍රමාණය | ප්‍රමුඛ වර්ණය |
|---|---|---|
| රු. 20 | මි.මී. 128 x 67 | මදටිය පැහැය |
| රු. 50 | මි.මී. 133 x 67 | නිල් |
| රු. 100 | මි.මී. 138 x 67 | තැඹිලි |
| රු. 500 | මි.මී. 143 x 67 | දම් |
| රු. 1000 | මි.මී. 148 x 67 | කොළ |
| රු. 5000 | මි.මී. 153 x 67 | රන් |

මුදල් අමාත්‍ය, අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේත්, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති අජිත් නිවාඩ් කබ්රාල් මැතිතුමාගේත් අත්සන්වල අනු පිටපත් මෙම නෝට්ටු කාණ්ඩයෙහි ඇතුළත්වන අතර දිනය 2010.01.01 ලෙස සඳහන් වේ.

**රුපියල් 20 නෝට්ටුව**
**ප්‍රමුඛ වර්ණය - මදටිය පැහැය**

**මුහුණත** - නෝට්ටුවේ මුහුණත මැද, කොළඹ වරායේ වර්තමාන දර්ශනයක් හා ඊට පසුබිමින් එහි පැරණි දර්ශනයක් දැක්වේ. නෝට්ටුවේ දකුණුපසට වන්නට ශ්‍රී ලංකා පඬුකන් බස්සා (පඩුවන් බස්සා) සහ නෝට්ටුවේ වම්පස පහළට වන්නට නිල්ගල සමනලයා දැක්වේ.

**පිටුපස** - නෝට්ටුව සිරස්ව අල්ලා බැලූ විට උඩරට නැටුම් සම්ප්‍රදායට අයත් වෙස් නැටුම් ශිල්පියෙක් සහ ගැටබෙර වාදන ශිල්පියෙක් ද පුන්කලස සහිත මුරගලක් සහ තනි ලියවැලක් ද දැක්වේ.

**රුපියල් 50 නෝට්ටුව**
**ප්‍රමුඛ වර්ණය - නිල්**

**මුහුණත** - මනම්පිටියේ ඉදිකළ නව පාලම, පසෙකින් දුම්රිය මාර්ගය එක්ව ගමන් කරන්නා වූ පැරණි පාලම කලාකරුවෙකුගේ නිර්මාණයක් ලෙසින් ද ඊට පසුබිමින් ශ්‍රී ලංකාවේ පැරණි ආරුක්කු දුම්රිය පාලම ද දැක්වේ. නෝට්ටුවේ දකුණු පසට වන්නට ශ්‍රී ලංකා අනු මැසිමාරා නමැති පක්ෂියා ද නෝට්ටුවේ වම්පස පහළට වන්නට පිටනිල් කොළයා නමැති සමනලයා ද දැක්වේ.

**පිටුපස** - නෝට්ටුව සිරස්ව අල්ලා බැලූ විට පහත රට නැටුම් සම්ප්‍රදායට අයත් වඩිගපටුන නැටුමේ යෙදන ශිල්පියෙක් සහ යක් බෙර වාදන ශිල්පියෙක් ද, පුන් කලස සහිත මුරගලක් සහ තනි ලියවැලක් ද දැක් වේ.

**රුපියල් 100 නෝට්ටුව**
**ප්‍රමුඛ වර්ණය - තැඹිලි පාට**

**මුහුණත** - නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය කලාකරුවෙකුගේ නිර්මාණයක් ලෙසින් සහ ඊට පසුබිමින් විදුලි රැහැන් සමඟින් දිස්වන ලක්ෂපාන දිය ඇල්ල දැක් වේ. නෝට්ටුවේ දකුණු පසට වන්නට ශ්‍රී

ලංකා රතු දෙමලිච්චා නමැති පක්ෂියා සහ නෝට්ටුවේ වම්පස පහළට වන්නට සරා කොළයා නමැති සමනලයා දැක් වේ.

**පිටුපස** - නෝට්ටුව සිරස්ව අල්ලා බැලූ විට ඉන්දීය ශාස්ත්‍රීය සම්ප්‍රදායට අයත් භරත නැටුමේ යෙදෙන ශිල්පිනියක් සහ මෘදංග බෙර වාදන ශිල්පියෙක් ද නාගරාජ මුරගලක් සහ ද්විත්ව ලියවැලක් ද දැක්වේ.

**රුපියල් 500 නෝට්ටුව**
**ප්‍රමුඛ වර්ණය - දම්**

**මුහුණත** - කොළඹ නගරයේ පිහිටි ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය හා ලංකා බැංකු මූලස්ථානය කලාකරුවෙකුගේ නිර්මාණයක් ලෙසින් සහ පසුබිමින් මහනුවර ලංකාතිලක විහාරයේ දර්ශනයක් දැක්වේ. නෝට්ටුවේ දකුණුපසට වන්නට ශ්‍රී ලංකා අළු ගිරවා නමැති පක්ෂියා සහ නෝට්ටුවේ වම්පස පහළට වන්නට හෙළ නීල පරමයා නමැති සමනලයා දැක්වේ.

**පිටුපස** - නෝට්ටුව සිරස්ව අල්ලා බැලූ විට, පහත රට දෙවොල් මඩු නැටුම් සම්ප්‍රදායට අයත් තෙල්මේ නැටුමේ යෙදෙන ශිල්පියෙක් සහ යක් බෙර වාදන ශිල්පියෙක් ද පද්මනිධි මුරගලක් සහ ද්විත්ව ලියවැලක් ද දැක්වේ.

**රුපියල් 1000 නෝට්ටුව**
**ප්‍රමුඛ වර්ණය - කොළ**

**මුහුණත** - ගම්පොළ - නුවරඑළිය මාර්ගයේ අලුතින් ඉදි වූ රම්බොඩ උමග එම ස්ථානයේ වූ පැරණි රම්බොඩ දුර්ගය පසුබිම් කරගනිමින් දැක්වෙන ආකාරය කලාකරුවෙකුගේ නිර්මාණයක් ලෙසින් දැක්වේ. නෝට්ටුවේ දකුණු පසට වන්නට ශ්‍රී ලංකා ගිරා මලිත්තා නමැති පක්ෂියා සහ නෝට්ටුවේ වම්පස පහළට වන්නට සිතිරි සිව්වා නමැති සමනලයා දැක්වේ.

**පිටුපස** - නෝට්ටුව සිරස්ව අල්ලා බැලූ විට සබරගමුව නැටුම් සම්ප්‍රදායට අයත් මල්පදය නැටුමේ යෙදෙන ශිල්පියෙක් සහ දවුල් බෙර වාදන ශිල්පියෙක් ද බහිරව රූප සහ දිසා පාලක රූප සහිත මුරගලක් සහ ද්විත්ව ලියවැලක් ද දැක් වේ.

**රුපියල් 5000 නෝට්ටුව**
**ප්‍රමුඛ වර්ණය - රන්**

**මුහුණත** - වෙහෙරගල වේල්ලේ දර්ශනයක් කලාකරුවෙකුගේ නිර්මාණයක් ලෙසින් සහ ඊට පසුබිමින් කැනියොන් වේල්ලේ දර්ශනයක් දැක්වේ. නෝට්ටුවේ දකුණු පසට වන්නට ශ්‍රී ලංකා කහ කණ්කොන්ඩයා සහ නෝට්ටුවේ වම්පස පහළ දෙහි සැරියා නමැති සමනලයා දැක්වේ.

**පිටුපස** - නෝට්ටුව සිරස්ව අල්ලා බැලූ විට, නාග රාක්ෂ නැටුමේ යෙදෙන ශිල්පියෙක් සහ ගුරුළු රාක්ෂ නැටුමේ යෙදෙන ශිල්පියෙක් ද රත්න ප්‍රාසාදය මුරගල සහ කල්ප වෘක්ෂ ලියවැල් මෝස්තරයක් ද දැක්වේ.

**නෝට්ටුවල අන්තර්ගත දැනට පවතින සහ නව වැඩි දියුණු කළ ආරක්ෂණ සලකුණු පහත දැක්වේ.**

**දිය සලකුණ**
එක් එක් නෝට්ටුවේ එකිනෙකට වෙනස් වූ පක්ෂීන්ගේ රූප දැක්වෙන අතර, එම පක්ෂි රූපයම අදාළ නෝට්ටුවේ දිය සලකුණු ලෙස දක්වා ඇත. තවද නෝට්ටුවේ වටිනාකම විශේෂිත දිය සලකුණක් ලෙසින් සිරස් අතට ඉලක්කම්වලින් දක්වා ඇත.

**ආරක්ෂණ නූල**
රුපියල් 5000, රුපියල් 1000 සහ රුපියල් 500, නෝට්ටුවල පිළිවෙලින් මි.මී. 3, මි.මී 2.5 හා මි.මී 2 යන පළලින් යුතු වූ, රතු සහ කොළ ලෙස වර්ණය වෙනස්වන්නා වූ “ස්ටාර්ක්‍රෝම්” ආරක්ෂණ නූල තැනින් තැන මතු වී පෙනෙන ලෙස යොදා ඇත. රුපියල් 20, රුපියල් 50

සහ රුපියල් 100 නෝට්ටුවල යොදා ඇති තුනී පොලියෙස්ටර් ආරක්ෂණ නූල සම්පූර්ණයෙන්ම නෝට්ටුවේ වටිනාකම හා CBSL යන අක්ෂර සමග නෝට්ටුව තුළට ඇතුල් කර ඇති අතර, එය අඛණ්ඩ ඉරක් ලෙස දිස්වේ.

**වැරගැන්වූ කොන්**
"වැරගැන්වූ කොන්" නමැති දිය සලකුණ එක් එක් නෝට්ටුවේ කොන් හතරේ විකර්ණ ආකාරයෙන් දිවෙන්නා වූ ඉරි ලෙසින් දැක්වේ.

**විනිවිද පෙනෙන සලකුණ**
නෝට්ටුව ආලෝකයට යොමුකොට බැලීමේ දී, නෝට්ටුවේ මුහුණත වර්ණ දෙකකින් කඩින් කඩ දක්වා ඇති වටිනාකම සඳහන් ඉලක්කම් (සමනල රූපය අසල) නෝට්ටුවේ පිටුපස ඇති ඒ හා සමාන ඉලක්කම් සමග එකිනෙකට සමපාත වී එක් වර්ණයක් සේ දිස්වේ.

**ඉතා කුඩා අක්ෂර**
නෝට්ටුවේ සමනල රූපයට පහළ කොටස් දෙස සමීපව බැලූවිට ඉතා කුඩා ලෙස මුද්‍රිත "CBSL"යන අක්ෂර සහ නෝට්ටුවේ වටිනාකම ඉලක්කමින් දැකිය හැකිය.

**දෘශ්‍යාබාධිත පුද්ගලයන් වෙනුවෙන් යොදා ඇති සලකුණ**
දෘශ්‍යාබාධිත පුද්ගලයන්ට නෝට්ටුවල වටිනාකම හඳුනාගැනීමට හැකි වන පරිදි නෝට්ටුවේ වම්පස සිරස් අතට රළු ලෙස මුද්‍රිත තිත් (රු.20 නෝට්ටුවේ එක් තිතක්) නෝට්ටුවේ වටිනාකම අනුව වැඩිවෙමින් යන ආකාරයට මුද්‍රණය කර ඇත.

**උස් වූ මුද්‍රිත**
නෝට්ටුව ඇඟිලිතුඩු මගින් ස්පර්ශ කිරීමේ දී උස්ව මුද්‍රිත ප්‍රදේශ හඳුනාගත හැකිය. උදාහරණ - නෝට්ටුවේ මුහුණත - මහ බැංකුව නමැති පාඨය සහිත කොටස සහ නෝට්ටුව මධ්‍යයේ පිහිටි මෝස්තර නෝට්ටුවේ පහළ කොළවරේ නෝට්ටුවේ වටිනාකම දක්වා ඇති කොටස. නෝට්ටුවේ පිටුපස - නෝට්ටුවේ පහළ නෝට්ටුවේ වටිනාකම දැක්වෙන ඉලක්කම්.

නව මුදල් නෝට්ටු කාණ්ඩයේ පළමු නෝට්ටු කට්ටලය අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා වෙත ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති අජිත් නිවාඩ් කබ්රාල් මැතිතුමා විසින් 2011 පෙබරවාරි මස 04 දින බුත්තල දී පැවැත්වෙන දැයට කිරුළ ප්‍රදර්ශනයේ දී උත්සවාකාරයෙන් පිරිනැමීමට නියමිත අතර මහජනතාවට පෙබරවාරි 04 සිට 10 දින දක්වා ප්‍රදර්ශන භූමියේ දී නව නෝට්ටු නිකුත් කරනු ලබයි.

නෝට්ටු සහ කාසි එකතුකරන්නන් සඳහා පහත සඳහන් අයිතමයන් 2011 පෙබරවාරි 07 සිට ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන කාර්යාලයෙන් හා රාජගිරිය මුදල් කෞතුකාගාරයෙන්ද පෙබරවාරි 14 වන දින සිට මහ බැංකුවේ පළාත් කාර්යාලවලින්ද මිලදී ගත හැක.

**ඒවායේ මිල ගණන් පහත දැක්වේ.**

| විස්තරය | විකුණුම් මිල (රු.) |
|---|---|
| වටිනාකම් 6 ම සහිත නෝට්ටු ඇසුරුම | 7,500.00 |
| රු.5,000 නෝට්ටුව සහිත ඇසුරුම | 5,500.00 |
| රු.1000 නෝට්ටුව සහිත ඇසුරුම | 1,250.00 |
| රු. 500 නෝට්ටුව සහිත ඇසුරුම | 750.00 |
| රු. 100 නෝට්ටුව සහිත ඇසුරුම | 250.00 |
| රු. 50 නෝට්ටුව සහිත ඇසුරුම | 200.00 |
| රු. 20 නෝට්ටුව සහිත ඇසුරුම | 150.00 |
| රු. 100 නෝට්ටු 40 කින් සමන්විත නොකැපූ නෝට්ටු පත්‍රිකාව | 7,000.00 |
| නව මුදල් නෝට්ටු කාණ්ඩයේ විස්තර ඇතුළත් සංයුක්ත තැටිය | 400.00 |

නව මුදල් නෝට්ටු ශ්‍රී ලංකා තුළ ඕනෑම මුදල් ගණනක් ගෙවීම සඳහා වලංගු වන අතර ඒවා සංසරණයේ පවතින තාක් ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීම වනු ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සංසරණය සඳහා නිකුත් කර ඇති අනෙකුත් නෝට්ටු තවදුරටත් ශ්‍රී ලංකාව තුළ ඕනෑම මුදල් ගණනක් ගෙවීම සඳහා යොදා ගැනීමට නීතියෙන් වලංගු වේ.

වැඩි විස්තර සඳහා:

| | | දුරකථන අංකය | ෆැක්ස් අංකය |
|---|---|---|---|
| ව්‍යවහාර මුදල් අධිකාරි | - | 2477355 | 2477726 |
| අතිරේක ව්‍යවහාර මුදල් අධිකාරි | - | 2477603 | |
| නියෝජ්‍ය ව්‍යවහාර මුදල් අධිකාරි | - | 2477014 | |
| විද්‍යුත් තැපෑල | - | currency@cbsl.lk | |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවිය | - | www.cbsl.gov.lk | |
| මුදල් කෞතුකාගාරය, රාජගිරිය | - | 011 2477809 | |
| **පළාත් කාර්යාල** | | | |
| අනුරාධපුරය | - | 025 2222048 | 025 2225689 |
| මාතර | - | 041 2222268 | 041 2222719 |
| මාතලේ | - | 066 2223367 | 066 2222175 |
| යාපනය | - | 021 2221855 | 021 2221857 |
| ත්‍රිකුණාමලය | - | 026 2242333 | 026 2242332 |

## 3. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් සම්පස්ථ ණය පහසුකම යටතේ සයවන ණය වාරිකය වශයෙන් එ.ජ.ඩොලර් මිලියන 216.6 ක් නිකුත් කෙරේ

*ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.) විසින් සම්පස්ථ ණය පහසුකමට අදාල පස්වන විමර්ශනය සාර්ථකව නිමකරමින් 2011 පෙබරවාරි 03 වැනි දින වි.ගැ.හි. මිලියන 137.8 (දළ වශයෙන් එ.ජ.ඩොලර් මිලියන 216.6) ක වටිනාකමින් යුත් සයවන වාරිකය මුදාහරින ලදී.*

මෙම මුදාහැරීමත් සමඟ 2009 ජූලි මාසයේ දී අනුමත වූ සම්පස්ථ ණය පහසුකම යටතේ ශ්‍රී ලංකාවට මේ වන විට ලැබී ඇති මුළු ණය ප්‍රමාණය එ.ජ.ඩොලර් බිලියන 1.5 කි. මෙම ණය මුදාහැරීම් මෙන්ම, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ඉහළ යෑම, විවිධ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සඳහා රජය වෙත ලැබුණු මූල්‍ය ප්‍රවාහ සහ පෞද්ගලික අංශය ලද ලැබීම්, රටේ සංචිත ප්‍රමාණය වඩාත් සතුටුදායක මට්ටමක් දක්වා ඉහළ නැංවීම සඳහා ඉවහල් විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් වර්තමානයේ දී දළ නිල සංචිත (ආසියානු නිෂ්කාශන සංගමයේ ලැබීම් රහිතව), එ.ජ.ඩොලර් බිලියන 6.8 ක මට්ටමේ පවතින අතර, එය ආනයනික මාස 6.2 කට සමාන වේ.

මේ හා සම්බන්ධ අභිප්‍රාය පළකිරීමේ ලිපිය (LOI) සහ තාක්ෂණික අවබෝධතා ගිවිසුම (TMU) ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියේ (www.cbsl.gov.lk) පළකර ඇත.

## 4. මුදල් ප්‍රතිපත්ති විවරණය - 2011 පෙබරවාරි

*කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (පදනම් වර්ෂය =2002) වෙනස මත පදනම් වූ උද්ධමනය, 2011 ජනවාරි මාසයේ දී බොහෝ දුරට ස්ථායීව පැවතුණි. වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මත උද්ධමනය, පෙර මාසයේ දී පැවැති සියයට 6.9 සමග සැසඳීමේ දී ජනවාරි මාසයේ දී සියයට 6.8 ක් විය. වාර්ෂික සාමාන්‍ය උද්ධමනය, පෙර මාසයේ දී සියයට 5.9 ක් වූ වාර්ෂික සාමාන්‍ය උද්ධමනය, ජනවාරි මාසයේ දී සියයට 6.0 ක් විය. පෙර මාසවල මෙන්ම, දර්ශකයේ සුළු වැඩිවීමට හේතු වූයේ ආහාර සහ මධ්‍යසාර නොවන පාන වර්ග කාණ්ඩයෙහි වැඩිවීමයි. මෙම මාසය තුළ ආහාර මිල ඉහළයාමට අහිතකර කාලගුණික තත්ත්වය හේතු විය. මෑතක දී ඇති වූ ගංවතුරෙන් වී නිමැවුම කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කළ ද ගබඩා කොට ඇති වී ප්‍රමාණය භාවිතා කළ හැකි වීම සහ යල කන්නය තුළ දී වගා කිරීම වැඩි කිරීමට ඇති හැකියාව හේතුවෙන් 2011 දී මිල පීඩනයන් සමනය කළ හැකි වනු ඇත. අනෙකුත් ආහාර බෝගයන්ගේ මෑතක දී වූ මිල ගණන් ඉහළ යාම ඉදිරි කාලය තුළ දී, තත්ත්වය සාමාන්‍ය අතට පත්වීමත් සමගම අඩුවනු ඇතැයි අපේක්ෂා කෙරේ.*

2011 දී ගෝලීය ආර්ථිකය, කලින් අපේක්ෂා කළ මට්ටමට වඩා වැඩි වේගයකින් යථා තත්ත්වයට පත්වනු ඇත. මේ හේතුවෙන් අපනයනවලින් ලැබෙන ආදායම තවදුරටත් වැඩි විය හැකි වුවද ගෝලීය වශයෙන් ප්‍රධාන පාරිභෝගික භාණ්ඩ සඳහා වන ඉල්ලුම, මත ඇතිවන බලපෑම මිල ගණන් කෙරෙහිද අහිතකර බලපෑමක් ඇති කරනු ඇත. එබඳු තත්ත්වයක බලපෑම පාලනය කිරීමේ ක්‍රියාමාර්ග අඛණ්ඩවම ගැනීමට අපේක්ෂිතය. මෑතකදී ක්‍රියාවට නංවන ලද පෙට්‍රල් ආනයන මත පනවා ඇති ආනයන බදු ඉවත් කිරීම සහ කිරිපිටි ආනයනය කිරීම මත වූ බදු අඩු කිරීම වැනි සමහර රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග මගින් අහිතකර ජාත්‍යන්තර මිල ගණන් මගින් දේශීය මිල ගණන් ඉහළයාම කෙරෙහි ඇතිකරනු ලබන පීඩනය, අඩු කරනු ඇත. සමස්තයක් ලෙස, මැදිකාලීනව රාජ්‍ය මූල්‍ය අංශයේ අපේක්ෂිත වැඩිදියුණු වීම් තුළින් දේශීය මිල ගණන් මත ඇතිවන පීඩනය සමනය වනු ඇත.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, රටෙහි ආර්ථික ක්‍රියාකාරිත්වය පිළිබඳ සමාලෝචනය පසුගිය සතියෙහි සම්පූර්ණ කළ විගස ඇනට ක්‍රියාත්මක වන සම්පස්ථ ණය පහසුකම යටතේ හයවන වාරිකය මුදාහැරීම සඳහා අනුමැතිය ලබා දීමත් සමග ශ්‍රී ලංකාවේ නිල සංචිත තවදුරටත් ශක්තිමත් විය. මේ අනුව, සම්පස්ථ ණය පහසුකම යටතේ මේ දක්වා සිදුකරන ලද මුළු මුදාහැරීම් ප්‍රමාණය විශේෂ ගැනුම් හිමිකම් මිලියන 964.6 ක් වේ (ආසන්න වශයෙන් එක්සත් ජනපද ඩොලර් බිලියන 1.516 කි).

2010 වසර අග සඳහා වන තාවකාලික දත්ත අනුව පුළුල් මුදල් සැපයුමෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය මුදල් සැපයුමේ අපේක්ෂිත වර්ධනයට අනුකූල වන ලෙස පැවති බව පෙන්නුම් කරයි. පෞද්ගලික අංශය සඳහා දෙනු ලැබූ ණය තවදුරටත් ඉහළ වර්ධන වේගයක් පෙන්වන අතර, මහ බැංකුව මෙම තත්ත්වයන් සමීපව අධීක්ෂණය කිරීම අඛණ්ඩව සිදු කරනු ඇත.

ආර්ථික ක්‍රියාකාරකම් තුළ පෞද්ගලික අංශයේ සහභාගිත්වය ප්‍රමාණවත් සහ අඛණ්ඩ ලෙස තවදුරටත් වර්ධනය කිරීම අරමුණු කරගෙන, 2011 වසරේ ජනවාරි මාසය තුළ සිදුකරන ලද ප්‍රතිපත්ති පොලී අනුපාතිකයන්ගේ අඩු කිරීමට කෙටිකාලීන පොලී අනුපාතික වඩා යහපත්ව ප්‍රතිචාර දක්වා ඇති වුවද, බොහෝ බැංකුවල ණය දීමේ අනුපාතික තවදුරටත් සංශෝධනය විය යුතුව ඇත. ඉහත වර්ධනයන් සියල්ල

සැලකිල්ලට ගනිමින් මුදල් මණ්ඩලය විසින් 2011 පෙබරවාරි මස 07 වන දින පැවැති රැස්වීමේ දී, වත්මන් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය නොවෙනස්ව පවත්වා ගැනීම යෝග්‍ය බව තීරණය කරන ලදී. මේ අනුව, මහ බැංකුවෙහි වත්මන් ප්‍රතිපත්ති පොලී අනුපාතික, එනම් ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකය සියයට 7 ක් ලෙස සහ ප්‍රතිවිකුණුම් අනුපාතිකය සියයට 8.50 ක් ලෙස නොවෙනස්ව පවතිනු ඇත.

මීළඟට නියමිත මුදල් ප්‍රතිපත්ති ප්‍රකාශය 2011 මාර්තු 08 වන දින නිකුත් කිරීමට නියමිතය.

## 5. අග්නිදිග ආසියානු මහ බැංකු අධිපතිවරුන්ගේ 46 වෙනි සමුළුව, උසස් මට්ටමේ සම්මන්ත්‍රණය සහ අග්නිදිග ආසියානු මහ බැංකු අධිපති මණ්ඩලයෙහි 30 වෙනි සමුළුව

**කොළඹ, ශ්‍රී ලංකාව, 2011 පෙබරවාරි 25 - 26**

ශ්‍රී ලංකා මහ බැංකුවේ 60 වෙනි සංවත්සරය සැමරීම වෙනුවෙන් පැවැත්විය යුතුව තිබෙන ප්‍රධාන අංගයන් අතුරින් එකක් වන අග්නිදිග ආසියානු මහ බැංකු අධිපතිවරුන්ගේ 46 වෙනි සමුළුව, උසස් මට්ටමේ සම්මන්ත්‍රණය සහ අග්නිදිග ආසියානු මහ බැංකු අධිපති මණ්ඩලයෙහි 30 වෙනි සමුළුව 2011 පෙබරවාරි මස 25 - 26 යන දිනයන්හි ශ්‍රී ලංකා මහ බැංකුවෙහි අනුග්‍රහයෙන් පවත්වනු ලැබේ. පශ්චාත් ගෝලීය මූල්‍ය අර්බුදය නැගී එන වෙළෙඳපොළවල මහ බැංකුවලට අදාල ගැටළු සහ අභියෝග මෙම වසරෙහි සමුළුවෙහි තේමාව වේ. මෙම සමාරම්භක උළෙලෙහි ප්‍රධාන ආරාධිත අමුත්තා වන්නේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාය. 2011/12 මෙහෙයුම් වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකු අධිපති අජිත් නිවාඩ් කබ්රාල් මහතා අග්නිදිග ආසියානු මහ බැංකු අධිපති මණ්ඩලයෙහි මූලසුන හොබවයි.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි නියෝජ්‍ය කළමනාකරණ අධ්‍යක්ෂ නයොකි ෂිනොහාරා මහතා, ජාත්‍යන්තර නිරාකරණ බැංකුවෙහි සාමාන්‍යාධිකාරි ජෙයිම් කරුවානා මහතා, ලන්ඩන් ආර්ථික විද්‍යා සහ දේශපාලන විද්‍යා ආයතනයෙහි මහාචාර්ය චාල්ස් ගුඩ්හාඩ් සහ ඉන්දියානු සංචිත බැංකුවෙහි හිටපු අධිපති සහ සම්මාන මහාචාර්ය, ආචාර්ය වයි.ජී.රෙඩ්ඩි යන ඉහළ මට්ටමේ නිලධාරීන් සහ ප්‍රමුඛ පෙළේ කථිකයන් මෙම සමුළුව සඳහා සහභාගි වේ. දකුණු ආසියානු කලාපීය සහයෝගිතා සමුළුවෙහි රටවල අධිපතිවරු නිරීක්ෂකයන් ලෙස මෙම සමුළුව සඳහා සහභාගී වෙති.

අග්නිදිග ආසියානු මහ බැංකු සංසදයට, මහ බැංකු 17 ක් ඇතුළත් වන අතර, එහි නවතම සාමාජිකයා වන්නේ චීන මහජන බැංකුවයි. අනෙකුත් අග්නිදිග ආසියානු මහ බැංකු අතරට බෲනායි මූල්‍ය අධිකාරිය, කාම්බෝජියානු ජාතික බැංකුව, ෆීජි සංචිත බැංකුව, ඉන්දුනීසියානු බැංකුව, කොරියානු බැංකුව, මැලේසියානු බැංකුව, මොංගෝලියානු බැංකුව, මියන්මාර් මහ බැංකුව, නේපාල රස්ට්‍රා බැංකුව, පැපුවා නිවුගිනියා බැංකුව, පිලිපීන බැංකුව, සිංගප්පූරු මූල්‍ය අධිකාරිය, ශ්‍රී ලංකා මහ බැංකුව, චීන තායිපේ මහ බැංකුව, තායිලන්ත බැංකුව සහ වියට්නාම් රාජ්‍ය බැංකුව අයත් වේ. මහජන ලාඕස් ප්‍රජාතන්ත්‍රවාදී ජනරජ බැංකුව සහභාගි නිරීක්ෂක බැංකුව ලෙස කටයුතු කරයි.

## 6. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද)
## 2009, 2010 සහ 2011

(2002= 100)

| මාසය | දර්ශකය | | | මාසික වෙනස්වීම % | | | ලක්ෂ්‍යමය වෙනස්වීම % | | | වාර්ෂික සාමාන්‍ය වෙනස්වීම % | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | **2009** | **2010** | **2011** | **2009** | **2010** | **2011** | **2009** | **2010** | **2011** | **2009** | **2010** | **2011** |
| ජනවාරි | 203.1 | 216.4 | 231.2 | -0.3 | 1.4 | 1.3 | 10.7 | 6.5 | 6.8 | 21.6 | 3.1 | 6.0 |
| පෙබරවාරි | 202.9 | 216.9 | 233.9 | -0.1 | 0.2 | 1.2 | 7.6 | 6.9 | 7.8 | 20.3 | 3.1 | 6.1 |
| මාර්තු | 202.0 | 214.8 | | -0.4 | -1.0 | | 5.3 | 6.3 | | 18.6 | 3.2 | |
| අප්‍රේල් | 201.0 | 212.6 | | -0.5 | -1.0 | | 2.9 | 5.8 | | 16.7 | 3.4 | |
| මැයි | 205.1 | 215.9 | | 2.0 | 1.6 | | 3.3 | 5.3 | | 14.7 | 3.6 | |
| ජූනි | 207.8 | 217.7 | | 1.3 | 0.8 | | 0.9 | 4.8 | | 12.5 | 3.9 | |
| ජූලි | 208.7 | 217.6 | | 0.4 | 0.0 | | 1.1 | 4.3 | | 10.4 | 4.2 | |
| අගෝස්තු | 208.1 | 218.6 | | -0.3 | 0.5 | | 0.9 | 5.0 | | 8.5 | 4.5 | |
| සැප්තැම්බර් | 208.6 | 220.7 | | 0.2 | 1.0 | | 0.7 | 5.8 | | 6.6 | 5.0 | |
| ඔක්තෝබර් | 209.4 | 223.3 | | 0.4 | 1.2 | | 1.4 | 6.6 | | 5.2 | 5.4 | |
| නොවැම්බර් | 211.0 | 225.8 | | 0.8 | 1.1 | | 2.8 | 7.0 | | 4.1 | 5.8 | |
| දෙසැම්බර් | 213.5 | 228.3 | | 1.2 | 1.1 | | 4.8 | 6.9 | | 3.4 | 5.9 | |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව